**ලාහුගල ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**--------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**---------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 12 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 19 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ලාහුගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**-------------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
**-------------------------------**

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී භාවිතා කල ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
**------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ආදායම් වියදම් ගිණුමේ රු.1,419,263 ක අතිරික්තය සමුච්චිත අරමුදලට එකතු නොකිරීම නිසා ශේෂ පත්‍රයේ දැක්වෙන හිමිකම් ඉහත වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) වාහන නැවතුම්පල ඉදිකිරීම සඳහා වැයකළ රු.2,873,007 ක් ස්ථාවර වත්කම් යටතේ රු.2,498,267 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ස්ථාවර වත්කම් රු.374,740 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2017 වර්ෂයට පෙර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 04 ක් සහ ප්‍රවර්ථන වර්ෂයේ ක්‍රියාත්මක කළ ප්‍රාග්ධන ව්‍යාපෘති 03 කට අදාළව කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු පිළිවෙලින් රු.423,675 හා රු. 3,890,204 ක් ණය හිමියන් ලෙස ශේෂ ගිණුම්ගත කර නොතිබීම නිසා ජංගම බැරකම් එම වටිනාකම්වලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ආදායම් පරීක්ෂක විසින් සෘජුවම බැංකුවට තැන්පත් කරන ලද රු.18,435 ක ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) දැනට භාවිතයට ගනු ලබන සභාවට අයිති රු.59,719,729 ක් වටිනා වාහන 05 ක් සහ වටිනාකම තක්සේරු නොකළ තවත් වාහන 03 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශවල දක්වා නොතිබීම නිසා ස්ථාවර වත්කම් වටිනාකම යථා ස්වරූපයෙන් දක්වා නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ හා 2013 වර්ෂයේ සිට ලැබිය යුතු මුද්දර ගාස්තු පිළිවෙලින් රු.497,000 ක් හා රු.630,500 ක් ආදායමට ගැනීමට කටයුතු නොකිරීම නිසා පිළිවෙලින් වර්ෂයේ ආදායම හා ජංගම වත්කම් එම ප්‍රමාණයන්ගෙන් අඩුවෙන් දක්වා තිබූ අතර, 2016 වර්ෂයට අදාලව ලැබුණු රු.404,718 ක මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර්, ඔක්තොම්බර් සහ නොවැම්බර් මාස වලට අදාලව ලැබිය යුතු උසාවි දඩ මුදල් රු.352,521 ක් ගිණුම්ගත නොකිරීම නිසා වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය හා ජංගම වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) ලංකා සුළු ධීවර සම්මේලනය මඟින් 2015 පෙබරවාරි 15 දින පවරා දෙන ලද පානම බහුකාර්යය ගොඩනැගිල්ලේ වටිනාකම තක්සේරු කර ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(එ) 2016 වර්ෂයේ සහ ඊට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්ථාවන්ට අනුව 2017 දෙසැම්බර් 08 දින විනාශ කල හා වෙන්දේසි කරන ලද අයිතම 75 ක වටිනාකම් හඳුනා ගෙන ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර තිබුණි.

**1.3.3 නොසැසඳුණු ගිණුම්**

---------------------------

ගිණුම් අංක 6162300 දරන ගිණුමට අදාල ව බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව මුදල් පොතේ ශේෂය රු.3,713,370 ක් වුවත්, බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය රු.3,653,273 ක් විය. ඒ අනුව රු.60,097 ක් අඩුවක් පැවතුණි.

**1.3.4 අවිනිශ්චිත ගිණුම**

-------------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද ශේෂ පත්‍රයේ ශුද්ධ වත්කම් හා හිමිකම අතර රු.1,966,628 ක වෙනසක් පෙන්නුම් කල අතර, එම අවිනිශ්චිත ගිණුම් ශේෂය හඳුනාගෙන ගිණුම් වල අවසන් ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.5 අනුකූල නොවීම්**

-----------------

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති සහ රෙගුලාසි ආදියට යොමුව | වටිනාකම (රු.) | අනුකූල නොවීම් |
| --- | --- | --- |
| (අ) ප්‍රාදේශීය සභා රීති 180 | | ප්‍රාදේශීය සභාවේ ආදායම් එකතු කිරීම, ගබඩා පාලනය හා චෙක්පත් නිකුත් කිරීමට අදාල නිලධාරීන් විසින් ඇප මුදල් තැන්පත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) මුදල් රෙගුලාසි 396 (ඇ) | 8,620 | ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවා තිබූ රු.8,620 ක් වටිනා චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 | 86,066 | 1988 සිට 2012 වර්ෂය දක්වා කාල සීමාව තුල අවස්ථා 10 කට අදාළ නිකුත් කර තිබූ රු.86,066 ක අත්තිකාරම් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 571 | 546,494 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම වූ රු.546,494 ක් වූ වර්ෂ 02 ඉක්මවූ තැන්පතු 06 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 1647 (ඉ) | -- | සභාවේ වාහන 21 ක් සම්බන්ධයෙන් වාහන ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 1646 | -- | වාහන 12 ක් සම්බන්ධයෙන් මාසික ගමන් පිළිබඳ සාරාංශ හා දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 භාණ්ඩාගාර චක්‍රලේඛය | -- | පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි |
| (ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | -- | |
| (i) 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 | -- | සභාව සතු ඉන්ධන පරීක්ෂාව සිදුකල යුතු වාහන 12 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. |
| (ii) 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2009 | -- | පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.346,946 ක්, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.647,966 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් සහ හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු | රු. | රු. | රු. | රු. | රු. | - රු. |
| වරිපනම් හා බදු | - | - | - | - | - | - | - | - |
| කුලී ආදායම් | 1,100,000 | 946,558 | 946,558 | 200 | 750,000 | 912,292 | 912,292 | 200 |
| බලපත්‍ර ගාස්තු | 205,000 | 219,960 | 219,960 | 26,783 | 200,500 | 138,500 | 138,500 | 26,783 |
| වෙනත් ආදායම් | 2,535,000 | 180,2166 | 1,802,166 | - | 3,425,000 | 1,164,638 | 1,164,638 | - |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාව විසින් 2017 දෙසැම්බර් 31 දිනට අයකළ යුතු මුළු ආදායම රු.2,995,667 ක් වූ අතරවර්ෂය තුල රු.2,968,684 ක් අයකර ගෙන තිබුණි. ඒ අනුව ආදායම් රැස් කිරීමේ ප්‍රතිශතය 99% ක මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

### 2.2.3 බලපත්‍ර ගාස්තු

ලෙජරය අනුව 2017 දෙසැම්බර් 31 දිනට නොගෙවූ බලපත්‍ර ගාස්තු රු.26,783 ක් වූ අතර, එම මුදල අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

### 2.2.4 වෙනත් ආදායම්

2009 අප්‍රේල් 17 දිනැති අංක1597/8 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව එක් දුරකථන කුළුණක් සඳහා අනුමැතිය ලබාදීමට අවම වශයෙන් රු.20,000 බැගින් අයකල යුතු වුවද, සභා බල ප්‍රදේශයේ පවතින දුරකථන කුළුණු 08 ක් සඳහා රු.160,000 ක මුදලක් අයකර නොතිබුණි.

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් නිලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.352,251 ක් හා මුද්දර ගාස්තු රු.630,500 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) රු.9,254,688 ක් වියදම් කරමින් පානම මහජන උද්‍යානයේ ඉදිකරන ලද කාමර 08 කින් යුත් ගොඩනැගිල්ලේ වැඩ කටයුතු 2017 දෙසැම්බර් 26 දින අවසන් කර තිබුණද, 2018 ජූලි 20 දින වන විටත් විවෘත කර නොතිබුණි. .

(ආ) රු.8,056,903 ක් වියදම් කර 2017 දෙසැම්බර් 26 දින ඉදිකිරීම් සම්පූර්ණ කරන ලද පානම මහජන උද්‍යානයේ වායු සමනය කළ කාමර 04 කින් යුක්ත ගොඩනැගිල්ල 2018 ජූලි 20 දින වනතුරු විවෘත කර නොතිබුණි.මේ නිසා මෙහි සවිකර ඇති
වායුසමීකරන වල වගකීම් කාලය ද භාවිතයකින් තොරවම අවසන් වෙමින් පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) පානම බහුකාර්ය ගොඩනැගිල්ලේ වැඩ කටයුතු රු.6,049,901 ක වියදමක් දරා 2017 දෙසැම්බර් 26 දින අවසන් කර තිබුණද, 2018 ජූලි 20 දින වනතුරු විවෘත කර නොතිබුණි.

(ඈ) රු.85,812,081 ක් වටිනා ගොඩනැගිලි පැවතිය ද සභා බල ප්‍රදේශය තුළ සභාවට නීත්‍යානුකූල අයිතියක් සහිත කිසිදු ඉඩමක් නොමැති බැවින්, ඉහත ගොඩනැගිලිවල නීත්‍යානුකූල අයිතිය සම්බන්ධයෙන් ගැටළු කාරී තත්වයක් පවතී.

(ඉ) භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව අස්ථානගතවී පුස්තකාල පොත් 1,537 ක් හා 2014 දෙසැම්බර් මාසයේ දී ගංවතුරින් විනාශ වූ පුස්තකාල පොත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

### 3.2 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

නිරීක්ෂණ පහත පරිදි විය.

(අ) ලාහුගල ප්‍රාදේශීය සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ ලේකම් හා සංවර්ධන නිලධාරී ඇතුලුව තනතුරු 06 ක නිලධාරීන් 09 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි.

0

(ආ) සභාවේ සේවය කල සේවකයන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.8,000 ක සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සේවක ණය සඳහා අයකල යුතු වාර්ෂික පොලී අනුපාතය 4.2 % ක් වුවත් ණය වාරික ගණනයේදී සිදුවූ වැරදි නිසා සේවකයන් 20 දෙනෙකුගෙන් රු.200,518 ක මුදලක් වැඩිපුර අයකර ගැනීම සඳහා ලේඛන සකස් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේදී පමණක් රු.54,379 ක් එසේ වැඩිපුර අයකර ගෙන තිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

ලාහුගල පිහිටි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 2 ක් 2017 ජූලි 26 වන දින කුළී පදනම මත ලබා දීමට හෝ වෙනත් කාර්යයක් සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 නඩත්තුව හා අලුත්වැඩියා නොකිරීම**

සභාව සතු වාහන 21 න් වාහන 11 ක් අලුත්වැඩියා කළ යුතු තත්වයේ පැවැතිය ද එම වාහන අලුත්වැඩියා කර භාවිතා නොකොට සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

**3.4.2 පවරා නොගත් වත්කම්**

පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) සභාව සතුව පවතින වාහන 21 න් වාහන 08 ක පමණක් අයිතිය සභාවේ නමට පවරා ගෙන තිබුණු අතර, ඉතිරි වාහන 13 සභාවට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) දැනට සභාවේ කටයුතු සඳහා භාවිතා කරන මුළු භූමි ප්‍රමාණය අක්කර 54.75 කින් යුත් ඉඩම් කැබලි 16 ක අයිතිය පවරාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

**3.4.3 වාහන උපයෝජනය**

පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) සභාව සතු වාහන 21 සඳහාම සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ආ) සභාව සතු වාහන 21 න් වාහන 15 ක් සඳහා රක්ෂණ සහතික ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.5. ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 අනුව සභාව විසින් 2017 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තථ්‍ය වියදම අතර සියයට 07 සිට සියයට 80 දක්වා පරාසයක විචලනයක් පැවති බැවින්, අයවැය ලේඛණය සඵල කළමණාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**5.** **පද්ධති හා පාලනය**

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.

| පද්ධතිය | | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | - | (i) ගිණුම් පොත්පත් හා ලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම<br>(ii) පොදු ලෙජරය තුලනය නොකිරීම |
| (ආ) | වත්කම් හා දේපල | - | (i) ලේඛනගත නොකිරීම<br>(ii) ආරක්ෂාව තහවුරු නොකිරීම<br>(iii) ඵලදායි ලෙස භාවිතයට නොගැනීම |
| (ඇ) | තොග | - | (i) ලේඛනගත නොකිරීම<br>(ii) අවිධිමත් තොග පාලනය |
| (ඈ) | ණයගැති හා ණයහිමි | - | (i) උපලේඛන පිළියෙල නොකිරීම<br>(ii) කාල විශ්ලේෂණ පිළියෙල නොකිරීම |
| (ඉ) | සේවක කළමණාකරණය | - | පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම |
| (ඊ) | ව්‍යාපෘතිය හා කොන්ත්‍රාත් | - | (i) ඇස්තමේන්තු පිළියෙල නොකිරීම<br>(ii) ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැති වීම |
| (උ) | ආදායම් කළමනාකරණය | - | ආදායම් ඇස්තමේන්තුගත කිරීම හා අයකර නොගැනීම |